# ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

වෘත්තීය අධ්‍යාපන අංශය

## කෘෂි යන්ත්‍රෝපකරණ කාර්මික ශිල්පී පාඨමාලාව 2025

## කලාපීය මධ්‍යස්ථානය - ආණමඩුව

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය ආණමඩුව කලාපීය මධ්‍යස්ථානයෙහි ආරම්භ කෙරෙන ඉහත පාඨමාලාව සඳහා ආධුනික/ ආධුනිකාවන් ඇතුලත් කර ගැනීමට පහත දැක්වෙන සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

- අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස.(සා.පෙළ) දක්වා
- ස්ථානය : ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය කලාපීය මධ්‍යස්ථානය - ආණමඩුව
- මාධ්‍ය : සිංහල
- පාඨමාලා අන්තර්ගතය :
  - මූලික කර්මාන්තශාලා පුහුණුව හා පෑස්සුම් ශිල්පය (Arc & Gas)
  - අස්වනු නෙළීමේ යන්ත්‍ර (Combine Harvester Machine), රෝද හතරේ ට්‍රැක්ටරය (Four Wheel Tractor) නඩත්තුව හා අලුත්වැඩියාව
  - බිම් සකස් කිරීමේ උපකරණ, පැළ සිටුවීමේ උපකරණ, තෙල් ඉසින උපකරණ නඩත්තුව සහ අලුත්වැඩියාව
  - එන්ජින් සම්ප්‍රේෂණ, තිරිංග සහ සුක්කානම් පද්ධති අලුත්වැඩියාව
  - කෘෂි යන්ත්‍ර සහ උපකරණ වල හයිඩ්‍රොලික් පද්ධති අලුත්වැඩියාව
- පාඨමාලා කාලය :වසර 01 1/2 (සතියේ දිනවල)
- පාඨමාලා ගාස්තු :පාඨමාලා ගාස්තු අයකරනු නොලබන අතර රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව පුහුණු දීමනාවක් ගෙවනු ලැබේ.
- වයස : 2025.09.23 දිනට වයස අවුරුදු 16 ට නොඅඩු සහ 22 ට නොවැඩි විය යුතුය.

ඉහත සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ආයතනීය නිල වෙබ් අඩවියෙහි (www.germantec.lk) සඳහන් ආදර්ශ අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසියක මුද්‍රණය කර පුරවා **මධ්‍යස්ථානාධිපති, ලං.ජ.කා.අ.ආ. කලාපීය මධ්‍යස්ථානය - ආණමඩුව, තම්මැන්නාගම, ගම් උදාව භූමිය, ආණමඩුව** යන ලිපිනයට 2025.10.06 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැල් මඟින් යොමුකල යුතුය. ලියුම් කවරය ඉහළ වම් කෙළවරේ **'ආණමඩුව කලාපීය මධ්‍යස්ථානයට ආධුනිකයින් බඳවා ගැනීම - 2025'** යනුවෙන් සඳහන් කළ යුතුය. පාඨමාලාව සාර්ථකව හැදෑරීමෙන් පසු පවත්වනු ලබන පරීක්ෂණ වලින් සමත්වන අය හට ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය මඟින් නිකුත් කරනු ලබන සහතිකය සහ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ Level 04) පිරිනැමේ.

කළමනාකාර-පරිපාලන හා මානව සම්පත්
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

e-mail: cgtrcanamaduwa@cgtti.lk
දු.අංකය: 0322263625

# ආදර්ශ අයදුම් පත්‍රය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය කලාපීය මධ්‍යස්ථානය - ආණමඩුව

**කෘෂි යන්ත්‍රෝපකරණ කාර්මික ශිල්පී පාඨමාලාව 2025**

1. නම : .................................................................
2. ලිපිනය : .................................................................
3. උපන්දිනය : .................................................................
4. ජාතික හැඳුනුම්පත් අංකය : .................................................................
5. දුරකථන අංකය - ස්ථාවර/ජංගම : .................................................................
6. දුරකථන අංකය - WhatsApp : .................................................................
7. විද්‍යුත් ලිපිනය : .................................................................
8. අධ්‍යාපන සුදුසුකම් : අ. පො. ස. (සා/පෙළ) වර්ෂය: ....................

| | විෂය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |

9. වෙනත් සුදුසුකම් : ......................................................................................................................

ඉහත සඳහන් කර ඇති කරුණු සත්‍ය බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් විස්තර වලින් යමක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර හෝ තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හැකි බව දනිමි.

............................ ..............................

දිනය අයදුම්කරුගේ අත්සන